# දීප ව්‍යාප්ත චිත්‍ර තරඟය

## මුල් දින කවරයකට සිතුවමක් තෝරා ගැනීම සඳහා

**2012 වසර එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 'සැමට සුනිත්‍ය බලශක්තිය සඳහා වන ජාත්‍යන්තර වසර' ලෙස නම් කර ඇත. සුනිත්‍ය බලශක්තිය වැදගත් තේමාවක් ලෙස සළකමින් එය පිළිබිඹු වන මුද්දරයක් නිකුත් කිරීම සඳහා තැපැල් සේවා අමාත්‍යංශය, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමඟ ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනය එක්ව කටයුතු කරයි. මේ සඳහා වන මුල්දින කවරයට සිතුවමක් තෝරාගැනීමට පාසල් දරුවන් අතර දීප ව්‍යාපත චිත්‍ර තරගයක් සංවිධානය කර ඇත. පාසල් දරුවන් තුළ සුනිත්‍ය බලශක්තිය හා බලශක්ති ප්‍රභවයන් පිළිබඳ උනන්දුවක් ජනිත කිරීම මෙම තරගයේ අරමුණයි.**

## තරගයේ විස්තරː

- තේමාව - 'සැමට සුනිත්‍ය බලශක්තිය'
- මෙම තරගය ශ්‍රී ලාංකික පාසල් දරුවන් සඳහා පමණක් වන අතර එක් අයෙකුට එවිය හැක්කේ එක් චිත්‍රයක් පමණි.
- චිත්‍ර තෝරාගන්නේ මුල්දින කවරය සඳහා පමණි.
- වයස් සීමාව 2012 ජනවාරි 31 දිනට අවුරුදු 14ට නොඅඩු, අවුරුදු 18ට නොවැඩි විය යුතුය.
- තේමාවට අනුකූලව දිග අඟල් 13 1/2 පළල අඟල් 9 සුදු කඩදාසියක, වටේට අඟල් 1/2 ක දාරයක් සිටින සේ ඇඳිය යුතුයි. (කෙන්ට් කඩදාසි වඩා සුදුසු වන අතර ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.)
- චිත්‍රයේ පිටුපස තමාගේ නම, උපන් දිනය, පෞද්ගලික ලිපිනය, දුරකථන අංකය (තිබේ නම්), පාසලේ නම හා ලිපිනය, ඉගෙනුම ලබන පන්තිය සඳහන් කළ යුතුය.
- චිත්‍රය පාසලේ විදුහල්පතිතුමා/තුමිය විසින් සහතික කළ යුතුය.
- තරගය සඳහා චිත්‍ර භාරගන්නා අවසාන දිනය 2012/01/31 දින වේ. 'සුනිත්‍ය බලශක්ති චිත්‍ර තරගය' ලෙස ඉහල වම් කෙළවර සටහන් කළ කවරයක බහා අවසාන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් පහත ලිපිනයට යොමු කරන්න.
- මුල්දින කවරයේ ප්‍රමිතීන්ට අනුව සිතුවම වෙනස් කිරීමට හිමිකරු එකඟ විය යුතු අතර ජයග්‍රහණය කරන හා තෝරාගන්නා සිතුවම්වල හිමිකම තැපැල් දෙපාර්තමේන්තුව සතුවේ.
- සිතුවම් විනිශ්චය කරනු ලබන්නේ විද්වත් මඩුල්ලක් විසිනි. මෙම මඩුල්ලේ හා ප්‍රැක්ටිකල් ඇක්ෂන් ආයතනයේ තීරණය අවසාන තීරණය වේ.
- ජයග්‍රාහී සිතුවම්වලට වටිනා මුදල් ත්‍යාග සහ තෝරාගන්නා සිතුවම් සඳහා සහතිකපත් හිමිවේ.
- තරගය සඳහා සිතුවම් යොමුකරන විට ඉහත කොන්දේසිවලට එකඟ බව සැළකෙන අතර දක්වා ඇති අවශ්‍යතා එකක් හෝ සපුරා නැති සිතුවම් භාරගනු නොලැබේ.



ශ්‍රී ලංකා තැපැල්
இலங்கை அஞ்சல்
SRI LANKA POST

SRI LANKA SUSTAINABLE ENERGY AUTHORITY

PRACTICAL ACTION
Technology challenging poverty


**කණ්ඩායම් නායක**
වැඩසටහන් සංවර්ධන අංශය,
ප්‍රැක්ටිකල් ඇක්ෂන්, 05, ලයනල් එදිරිසිංහ මාවත, කොළඹ 05
දුරකථනː 011 2829412 ෆැක්ස්ː 011 2856188
වෙබ් අඩවිː www.janathakshan.net, www.practicalaction.org


**පාසැල් ළමුන් සඳහා පමණයි**